**ශීර්ෂය 124 - සමාජ සවිබලගැන්වීම් , සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය, සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු ආවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවැරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 124- සමාජ සවිබලගැන්වීම් , සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 12 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාජ සවිබලගැන්වීම් , සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.6 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හා 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි 127 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. | ලේඛන හා පොත් පවත්වා නොතිබීම | 2.5 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | කළමනාකරණ අඩුපාඩු | 2.4(අ)- (ඇ) |
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම. | වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම. | 2.1(අ)(ii) |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 බැදීම් හා බැරකම්

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02 (අ) ඡේදයට අනුකූල නොවී වැය විෂයයන් 23 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 221 ප්‍රතිපාදනය රු.මිලියන 23 ක් ඉක්මවා රු.මිලියන 244 ක බැදීම් ඇති කර ගෙන තිබුණි.

## 2.2 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 02 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන | උපයෝජනය රු.මිලියන | ඉතිරිය රු.මිලියන | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| 2016 | පුනරාවර්තන | 11,791 | 11,383 | 407 | 3 |
| | මූලධන | 255 | 239 | 17 | 7 |
| | **එකතුව** | **12,046** | **11,622** | **424** | **4** |
| 2017 | පුනරාවර්තන | 12,153 | 11,787 | 365 | 3 |
| | මූලධන | 754 | 343 | 412 | 55 |
| | **එකතුව** | **12,907** | **12,130** | **777** | **6** |

**විසර්ජන ගිණුම**

**අධි ප්‍රතිපාදන සලසා තිබීම**

වැය විෂයයන් 11 ක් සඳහා එකතුව රු.435,976,929ක අධි ප්‍රතිපාදන සලසා තිබීම සහ එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.295,298,491 ක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 79 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 12401යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| **24.00** | **23.87** | **7.00** | **18.49** | **70.00** | **49.33** |

**2.4** **කළමනාකරණ දුර්වලතා**

-----------------------------

**(අ)** **වැඩිහිටි දීමනාව ලබාදීම**

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුළ අඩු ආදායම්ලාභී වැඩිහිටියන් 386,080 ක් සඳහා රු.2,000 ක දීමනාව ගෙවීමට රු. මිලියන 9.265.92 ක්වූ ප්‍රතිපාදන සලසා තිබුණත් ගෙවීම් කර තිබුණේ වැඩිහිටියන් 375,317 ක් සඳහා පමණක්වීම හේතුවෙන් වැඩිහිටියන් 10,763 ක් සඳහා ගෙවිය හැකිව තිබුණු රු. මිලියන 258.31 ක්වූ මුදලක් ගෙවා නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 06 දින ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙම වැඩිහිටි දිමනාව ලබා දීමේ ප්‍රමාදයක් ඇති බවත්, නියමිත කාලය තුළ දීමනාව ලබා දිය යුතු බවත් අමාත්‍යාංශ ලේකම් වෙත ලිඛිතව දක්වා තිබුණත්, ඒ පරිද්දෙන් කටයුතු නොකිරීමෙන් (i) **හි සඳහන් ඉතිරිය නිරීක්ෂණය විය.**

**(ආ)** **ආබාධිත දීමනාව ලබාදීම**

-----------------------------

සමාලෝචිත වර්ෂය තුළ අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයන් 30,654 ක් සඳහා දීමනා ගෙවීමට රු. මිලියන 1,103.54 ක්වූ ප්‍රතිපාදන සලසා තිබුණත් ගෙවීම් කර තිබුණේ ආබාධිත පුද්ගලයන් 30,077ක් සඳහා පමණක් වීම හේතුවෙන් ආබාධිත පුද්ගලයන් 577 සඳහා ගෙවිය හැකිව තිබුණු රු. මිලියන 20.75 ක් ක්වූ මුදලක් ගෙවා නොතිබුණි.

**(ඇ)** **වකුගඩු ආධාර ලබාදීම**

------------------------

පහත කරුණු නිරීක්ෂනය කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ ජනවාරි මාසයේදී දිස්ත්‍රික්ක 09 ක් තුල හදුනාගත් වකුගඩු රෝගීන් සංඛ්‍යාව 19,645 ක් වු අතර මැයි මාසයේදී එම රෝගීන් සංඛ්‍යාව 21,500 ක් දක්වා වැඩි වී තිබුණි. කෙසේ වුවද, දෙසැම්බර් මාසය වනවිට වකුගඩු රෝගීන් 19,010 දෙනෙකුට පමණක් ආධාර ගෙවීම හේතුවෙන් ආධාර අපේක්‍ෂාවෙන් සිටි රෝගීන් 2,490 ක් සඳහා ගෙවීම් කර නොතිබුණි. තවද, අමාත්‍යාංශය විසින් වකුගඩු රෝගීන්ගේ පොරොත්තු ලේඛනය මාසිකව හෝ ත්‍රෛයිමාසිකව සකස් නොකිරීම හේතුවෙන් වර්ෂය අවසානයට වකුගඩු රෝගීන්ට බෙදාදිමට තිබුණු රු.38,458,200 ක ආධාර මුදල් ඌන උපයෝජනයව පැවතුණි.

(ii) සමාජ සේවා අමාත්‍යාංශ ලේකම් විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත නිකුත් කරන ලද 2014 දෙසැම්බර් 30 දිනැති අංක 1/2015 දරන චක්‍රලේඛයේ 5 ඡේදය ප්‍රකාරව දැඩි ලෙස වකුගඩු රෝගයට ගොදුරුවී ඇති රෝගින් සඳහා ජීවනාධාර ගෙවීම සෑම මාසයකම 10 දින ගෙවීම සිදුකල යුතු විය. එසේම ගෙවීම් ලේඛනයේ සහතික කළ පිටපතක් අදාළ මාසයේ 31 දිනට පෙර අමාත්‍යාංශය වෙත යොමු කල යුතු බවට උපදෙස් දී ඇතත් අදාළ දිස්ත්‍රික්ක 09 න් එවැනි ලේඛන මාසිකව ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය /මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගෙන තිබුණු රු.5,264,240 ක් වූ වත්කම් 02 ක් සහ වර්ෂය තුළ ඉදිකිරීම් වටිනාකම රු.51,690,000 ක් ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

## 2.6 මානව සම්පත් කළමනාකරණය

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 229ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු. 538,912 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 51 | 32 | 19 | - |
| (ii) | තෘතියික මට්ටම | 06 | 07 | - | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 473 | 314 | 159 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 84 | 72 | 12 | - |
| | එකතුව | 614 | 425 | 190 | 01 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) උපදේශන සහකාර හා සංවර්ධන නිලධාරී (උපදේශන) තනතුරු පුරප්පාඩු, බාහිර අයදුම්කරුවන්ගෙන් බඳවා ගැනීම සඳහා 2017 පෙබරවාරි 15 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. ඒ සඳහා 2017 සැප්තැම්බර් 17 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සංවර්ධන නිලධාරී (උපදේශන ) සඳහා 224 ක් හා ආශ්‍රිත සේවා ගණයේ උපදේශන සහකාර තනතුරු 100 ක් යටපත් කිරීමට යටත්ව මනෝවිද්‍යා උපදේශන නිලධාරී 324 ක් බඳවා ගැනීමට අනුමැතිය ලබාදී තිබුණි. කෙසේ වුවද බඳවා ගැනීමේ පරිපාටිය අවසන් කෙටුම්පත සකස්කර රාජ්‍ය සේවා කොමිෂමට ඉදිරිපත් කිරීම ප්‍රමාද තත්ත්වයක පැවති බැවින් 2018 සැප්තැම්බර් 30 දින වනවිටත් මෙම බඳවාගැනීම් සිදු කර නොතිබුණි.

**(ආ) කාර්යමණ්ඩල පුහුණු කිරීම**

**--------------------------------**

සමාලෝචිත වර්ෂයට උපදේශන අංශයේ පුහුණු වැඩසටහන් 03 ක් පැවැත්වීමට සැළසුම් කර තිබුණු අතර ඒ සඳහා රු.1,400,000 ක් වූ ප්‍රතිපාදන සලසා තිබුණි. කෙසේ වුවද පුහුණු වැඩ සටහන් සඳහා සහභාගී වියයුතු නිලධාරීන් සංඛ්‍යාව පිළිවෙලින් 214,116 ක් හා 214 ක් වුවද එහිදී පුහුණු වැඩසටහන් 04 ක් පවත්වා සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව පිළිවෙලින් 20,13,121 හා 38 ක් විය. ඒ අනුව රු.1,420,000 ක් වියදම් කිරීමෙන් අඩු නිලධාරීන් සංඛ්‍යාවක් පුහුණු කිරීමට වැඩි පිරිවැයක් දරා තිබුණි.